**ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ - 'බී' සංරචකය - 2014**

---

ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ - 'බී' සංරචකය 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2010 ජුනි 07 දින එළඹි අංක 2626 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 (අ) වගන්තිය හා 2011 අගෝස්තු 11 දින එළඹි අංක 0246 - එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ ගිවිසුම්වලට අනුව, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ව්‍යාපෘති සම්බන්ධීකරණ හා තත්ත්ව සහතික ඒකකය ව්‍යාපෘතියේ 'බී' සංරචකය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මූලික උපයෝගිතා ප්‍රතිස්ථාපනය කිරීම මඟින් ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල, ජීවනෝපායයන්, ආර්ථික යටිතල පහසුකම් හා පරිපාලන සහ නෛතික සේවා ප්‍රතිස්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ගිවිසුම් අනුව, 'බී' සංරචකයේ යළි වෙන්කළ මුළු පිරිවැය එජඩො මිලියන 31.17 ක් වූ අතර ඉන් එජඩො මිලියන 26.29 ක් හෙවත් සියයට 84 ක් ණයක් වශයෙන් හා එජඩො මිලියන 1.50 ක් ප්‍රදානයක් වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යටතේ සිවිල් වැඩ සඳහා සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ජුනි 07 දින ආරම්භ කරන ලද අතර, 2014 සැප්තැම්බර් 30 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා අරමුදල් සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය සහ ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

-----------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

------------------------------------------

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------------

2007 අගෝස්තු 07 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන චක්‍රලේඛයට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 ට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර 2016 ජනවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**2.2.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම**

-------------------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පරිදි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ රඳවාගත් රු.මිලියන 7.38 ක වැය නොකළ මුදල් ශේෂය 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට ආපසු ගෙවා තිබුණි. කෙසේ වුවද ආපසු ගෙවන ලද ශේෂය තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.3 ගෙවිය යුතු ශේෂය

ප්‍රදාන යටතේ සිදුකරන ලද ඉදිකිරීම් වැඩ 02 ක් සඳහා වූ රඳවා ගැනීම් මුදල් එකතුව රු.මිලියන 10.95 ක් මුදා හැරීම සඳහා ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | 2014 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | | | | | | | |
| - ණය | 26.29 | 3,437.42 | 2,178.95 | 10.87 | 1,413.70 | 25.19 | 3,275.54 |
| - ප්‍රදාන | 1.50 | 196.13 | - | - | - | 1.40 | 180.81 |
| ශ්‍රීලංර | 3.38 | 442.59 | 544.80 | 0.93 | 120.90 | 1.69 | 219.73 |
| | 31.17 | 4,076.14 | 2,723.75 | 11.80 | 1,534.60 | 28.28 | 3,676.08 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතියේ බී - සංරචකය සඳහා රු.මිලියන 4,076 කට සමාන එජඩො මිලියන 31.17 ක් වූ මුළු වෙන්කිරීමෙන් සියයට 90 ක් නියෝජනය වන රු.මිලියන 3,676 කට සමාන එජඩො මිලියන 28.28 ක් ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානයට උපයෝජනය කර තිබුණි. රු.මිලියන 2,022.7 කට සමාන එජඩො මිලියන 15.47 ක් හා රු.මිලියන 1,263.04 කට සමාන එජඩො මිලියන 9.66 ක් පිළිවෙලින් ලංකා විදුලිබල මණ්ඩලයේ හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සිවිල් වැඩ සඳහා වෙන් කර තිබූ අතර ඉන් පිළිවෙලින් රු.මිලියන 1,595.73 කට සමාන එජඩො මිලියන 12.37 ක් හා රු.මිලියන 991.02 කට සමාන එජඩො මිලියන 7.62 ක් පමණක් අදාළ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) රු.මිලියන 604.34 කට සමාන එජඩො මිලියන 4.64 ක් වටිනා ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් සමාලෝචිත වර්ෂය අවසානයට රඳවා තබාගෙන තිබූ බව නිරීක්ෂණය විය. තවද උපයෝජනය නොකළ අරමුදල් වෙන්කිරීම් මත බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 24.89 කට සමාන එජඩො 314,740 ක් 2014 දෙසැම්බර් 31 දිනට ණය නියෝජිතායතනය විසින් අයකර ගෙන තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, 2012 ජුනි වන විට නිම කිරීමට අපේක්ෂිත වූ යාපනය අර්ධද්වීපයේ විදුලිබල සම්ප්‍රේෂණ රැහැන ප්‍රතිස්ථාපනය කිරීම නිමකර තිබුණේ 2014 සැප්තැම්බර් මාසයේදීය. තවද විදුලිබල සම්බන්ධතාවය ලබාදීම සඳහා අපේක්ෂා කර තිබූ නිවාස 160,000 ක් අතුරින් නිවාස 120,000 කට පමණක් 2014 දෙසැම්බර් 31 දිනට විදුලිබලය ලබා දී තිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද උතුරු පළාතේ පොයින්ට් පේද්‍රුරුවල හා නැගෙනහිර පළාතේ ඊච්චලම්පත්තු හි ජල සම්පාදන යෝජනා ක්‍රමවල ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම ප්‍රමාදවීම හේතුවෙන් එම ඉදිකිරීම් වැඩ පිළිවෙලින් මාස 18 ක හා මාස 12 ක ප්‍රමාදයන් සහිතව 2014 සැප්තැම්බර් මාසයේදී නිම කර තිබුණි.

## 3.3 පරිබාහිර කටයුතු

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කාර්යයන්වලට ඍජුවම සම්බන්ධ නොවූ කුඩා වාරිමාර්ග වැඩ පිළිබඳ කාර්යයන් සඳහා රු.මිලියන 625.03 ක මුදලක් ව්‍යාපෘති සම්බන්ධීකරණ හා තත්ත්ව සහතික ඒකකය විසින් වැයකර තිබුණි.

(ආ) 2011 වර්ෂයේදී නැතිවූ රු.67,863 ක් වටිනා කාර්යාල උපකරණ සඳහා වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගැනීමට හා පාඩුව අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව ව්‍යාපෘතියේ ජංගම වත්කම් යටතේ අඛණ්ඩව දක්වා තිබුණි.

## 3.4 ව්‍යාපෘති කටයුතු වසා දැමීම

-------------------------------

2014 සැප්තැම්බර් 30 දිනට ව්‍යාපෘති කාර්යයන් වසා දමා තිබූ අතර සියලු සුදුසු වියදම් ද ඉල්ලීම් කර 2015 දෙසැම්බර් 31 දිනට පෙර ආපසු ලබාගෙන තිබුණි. කෙසේ වුවද 2016 අප්‍රේල් 30 වන විටත් ව්‍යාපෘති නිම කිරීමේ වාර්තාව උපදේශකවරුන් විසින් ඉදිරිපත් කර නොතිබුණි. ලැබුණු තොරතුරු අනුව, ස්ථාවර වත්කම් විෂයයන් 224 කින් ස්ථාවර වත්කම් විෂයයන් 28 ක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවලට භාර දී තිබුණි. තවද ඉතිරි වත්කම් අදාළ පාර්ශවයන්ට භාරදීමට හා වසාදැමීමේ ගිණුම් පිළියෙල කිරීමට ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් කටයුතු කර නොතිබුණි.